# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

# තනතුරු ඇබෑර්තු

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. ගෘහ නිර්මාණ ශිල්පී තනතුර - (මධ්‍යම කළමනාකරණ පළමු මට්ටම) - කොන්ත්‍රාත් පදනම

**(අ) යෝග්‍යතාවය :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ උපාධියක් ලබා තිබීම

සහ

ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පී ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය (AIA (SL)

සමග

උපාධිය ලබාගැනීමෙන් පසු පිළිගත් ආයතනයකින් ලබාගත් වාණිජ ගොඩනැගිලිවල ගෘහ නිර්මාණ සැලසුම් කිරීම පිළිබඳ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්ද

**(ආ) වැටුප :**

මාසික දළ වැටුප රු. 180,000/- යි. (සාකච්ඡා කළ හැකියි)

**සටහන :** අයදුම්කරුවන් විසින් ගෘහ නිර්මාණ ශිල්පීන් ලියාපදිංචි කිරීමේ මණ්ඩලයේ ලියාපදිංචිය ලබා තිබිය යුතු අතර, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට එය අලුත් කර තිබිය යුතුයි.

## 02. ගෘහ අභ්‍යන්තර සැලසුම් ශිල්පී තනතුර (මධ්‍යම කළමනාකරණ පළමු මට්ටම) - කොන්ත්‍රාත් පදනම

**(අ) යෝග්‍යතාවය :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගෘහ අභ්‍යන්තර සැලසුම්කරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ ඒ හා සමාන විෂය ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම

සමග

උපාධිය ලබාගැනීමෙන් පසු පිළිගත් ආයතනයකින් ලබාගත් ගෘහ අභ්‍යන්තර සැලසුම්කරණය පිළිබඳ අවම වශයෙන් වසර දෙකක (02) ක පළපුරුද්ද

**(ආ) වැටුප :**

මාසික දළ වැටුප රු. 180,000/- යි. (සාකච්ඡා කළ හැකියි)

**වයස් සීමාව :**

අවුරුදු 45 ට අඩුවිය යුතුය. (මෙම වයස් සීමාව රාජ්‍ය සේවයේ හෝ ව්‍යවස්ථාපිත සංස්ථාවල සේවයේ නියුතු අයදුම්කරුවන් හට අදාළ නොවේ)

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමග ප්‍රධාන මානව සම්පත් **කළමනාකරු, මානව සම්පත් කොට්ඨාසය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13** යන ලිපිනයට ලැබෙන සේ 2023.12.19 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුව හොත් අදාළ දෙපාර්තමේන්තු / සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට එහි සටහන් කර තිබිය යුතුය.

**සභාපති**